හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
**Department of Treasury Operations**

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | දුරකථන / தொலைபேசி / Telephone: +94 11 2484729 | ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 11 2431498 | ඊ-මේල් / மின்-அஞ்சல் / E-mail: dgto@tod.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number: TO/DCM/CLOCB/2014 | ඔබේ අංකය / உமது இல / Your Number: | දිනය / திகதி / Date: 2016.11. 18 |

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක - 07/2016

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**2016 වසර සඳහා මුදල් පොත පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම**

2016 වර්ෂය අවසානයේ මුදල් පොත පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම සඳහා මෙහි පහත සඳහන් පියවරයන් තරයේ අනුගමනය කරමින්, එම නිශ්චිත දිනට හෝ එදිනට පෙර අදාල කටයුතු සංවිධානය කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**1. 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම**

2016 වර්ෂයේ මුදල් පොත්, 2016 දෙසැම්බර් 31 දිනය අවසානයේ දී පහත සඳහන් ආකාරයට පියවිය යුතුය.

අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම කාර්යාල සහ උප කාර්යාලවල ගිණුම් පියවීම පිණිස අදාල වගකිව යුතු මාණ්ඩලික නිලධාරියෙකුට එම නිලධාරියාගේ නමින්ම බලය පැවරිය යුතු අතර, එම ලිපියේ පිටපතක් විගණකාධිපති වෙත යැවිය යුතුය. එසේ බලය පවරන ලද නිලධාරියා විසින් 2016 වර්ෂය සඳහා වූ මුල්‍යාමය ගණුදෙනු 2016 දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු අතර, එදිනට පසු කිසිම මුල්‍යාමය ගණුදෙනුවක් 2016 වර්ෂය වෙනුවෙන් සිදු නොකළ යුතුය. තවද එම නිලධාරියා විසින් සිගාස්(CIGAS) වැඩසටහනට සමගාමීව තවදුරටත් මුදල් පොත් භාවිතා කරන කාර්යාල තුල 2016 දෙසැම්බර් 31 දිනට පසු කිසිදු මුල්‍යාමය ගණුදෙනුවක් 2016 වර්ෂයට අදාල මුදල් පොත්වල සටහන් කළ නොහැකි වන සේ, එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ, 2016 වර්ෂයේ මුදල් පොත් පියවා තම නම, අත්සන, තනතුර, දිනය සහ වේලාව සහිත සටහනක් තැබිය යුතුය.

**2. 2016 වර්ෂය සඳහා වූ අක් මුදල් ගිණුම (7002) පියවීම සඳහා වර්ෂය අවසානයේ මුදල් පොත් ශේෂය මහ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම**

**2.1.** අමාත්‍යාංශ සහ උපකාර්යාල රහිත දෙපාර්තමේන්තු විසින් 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ආකෘති අංක:ටීඕඩී/අයිඑම්පී/06 සම්පූර්ණ කර, 2017 ජනවාරි 02 දින ඔබගේ නිල බැංකු ගිණුම පවත්වා ගෙන යනු ලබන බැංකු ශාඛාවට භාර දිය යුතු අතර, බැංකුවෙන් ඔබ වෙත ලැබෙන "හර" නිවේදනය ලද වහාම එහි සහතික කරන ලද පිටපතක් සමඟ ආකෘති අංක:ටීඕඩී/අයිඑම්පී/06 හි පිටපත ද මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවිය යුතුය.

**2.2.** අමාත්‍යාංශ සහ උපකාර්යාල සහිත දෙපාර්තමේන්තු මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය සඳහන් කරමින් ආකෘති අංක:ටීඔඩී/අයිඑම්පී/06 සම්පූර්ණ කර 2017 ජනවාරි 04 දින හෝ ඊට පෙර අදාල බැංකු ශාඛාවට භාර දිය යුතු අතර, බැංකුවෙන් ලැබෙන "භර" නිවේදනය ලද වහාම එහි සහතික කරන ලද පිටපතක් සමඟ ආකෘති අංක:ටීඔඩී/අයිඑම්පී/06 හි පිටපතද නොපමාව මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන සේ එවිය යුතුය.

**2.3.** උප කාර්යාල වෙත ලබා දී ඇති අතුරු අග්‍රිම සහ නිලධාරින් වෙත ලබා දී ඇති අනෙකුත් අග්‍රිමද, 2017 ජනවාරි මස 02 වන දිනට භාණ්ඩාගාරයට පියවීමට හැකිවන පරිදි ඔබ විසින් අවශ්‍ය පූර්ව විධි විධාන යොදා ගත යුතු අතර උප කාර්යාල වලින් 2016 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය ගෙන්වා ගැනිම සඳහාද අදාල බැංකු ශාඛා කළමනාකරුවන් සමඟ සාකච්ඡා කොට ඉහත 2.1. සඳහන් වූ පරිදි පහසු ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු කල යුතුය.

**2.4.** මෙම දෙපාර්තමේන්තුව විසින් 2017 ජනවාරි මාසයේ වැඩ කරන පළමු දින තුලදී 2017 වර්ෂය සඳහා අග්‍රිම නිදහස් කිරීමට කටයුතු කරනු ලබන බැවින් කිසිදු අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් 2016 වර්ෂයේ අග්‍රිම ශේෂයන්ගෙන් කිසිදු කොටසක් රඳවා ගත යුතු නොවේ. වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂයක් නොමැති වුවද, ඒ බැව් සඳහන් හිස් වාර්තාවක් ඉහත 2.1 හා 2.2 හි උපදෙස් ප්‍රකාරව නොපමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුවේ.

**2.5.** අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 2017 වර්ෂය වෙනුවෙන් ප්‍රථම අග්‍රිමය නිකුත් කිරීමෙන් පසුව ඉදිරි අග්‍රිම නිකුත් කිරීම පිණිස සලකා බලනු ලබන්නේ ඉහත 2.1, 2.2 සහ 2.3 ඡේදයන්හි සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමෙන් අනතුරුව පමණක් බව ද කාරුණිකව සලකන්න.

**3.<u>2016 වර්ෂය සඳහා වූ ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර අක් මුදල් ගිණුම (7003) පියවීම සඳහා වර්ෂය අවසානයේ මුදල් පොත් ශේෂය මහ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම</u>**

**3.1.** ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශාධාර සඳහා 7003/0/0/../16 සංකේත අංකය යටතේ, ව්‍යාපෘති විසින් ලබා ගත් අග්‍රිමයෙන්, 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය තහවුරු කරමින් ආකෘති අංක:ටීඔඩී/අයිඑම්පී/07 නිසි පරිදි සම්පූර්ණ කර 2017 ජනවාරි 02 දින ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාවට භාර දිය යුතු අතර බැංකුවෙන් ඔබ වෙත ලැබෙන "භර" නිවේදනයේ සහතික කරන ලද පිටපතක්ද සමඟ ආකෘති අංක:ටීඔඩී/අයිඑම්පී/07 සහ ටීඔඩී/අයිඑම්පී/07(i) නිවැරදිව සම්පූර්ණ කර අදාල අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක්ද සහිතව නොපමාව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

**3.2.** ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර යටතේ ලබා දී ඇති අග්‍රිම හැර වෙනත් කිසිදු ලැබීමක් 7003 අග්‍රිම සංකේතය යටතේ ගිණුම් ගත කළ නොහැකි වන බැවින්, වෙනත් ලැබීම් මෙම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට(ටීඔඩී/අයිඑම්පී/07(i)) ඇතුළත් නොකළ යුතු අතර, එවැනි ලැබීම් 7002 අග්‍රිම ගිණුම් අංකය යටතේ පමණක් ගිණුම් ගත කළ යුතුවේ.

**4.** පූර්ව වර්ෂ වෙනුවෙන් පියවිය යුතුව ඇති යම් හිඟ අග්‍රිම ශේෂයක් වේනම්, ඒවා නියමිත පරිදි නොපියවීම හෝ ගිණුම් කටයුතුවලට අදාලව මෙම දෙපාර්තමේන්තුවට සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනයන් ට ඉදිරිපත් කළ යුතු වන වාර්තා නිසි කලට ඉදිරිපත් නොකිරීම මෙන්ම මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව කටයුතු නොකිරීම, භාණ්ඩාගාරය විසින් එම ආයතනය වලට අග්‍රිම නිකුත් කිරීම තාවකාලිකව නතර කරනු ලැබීමට හේතු වනු ඇත.

5. මෙම කරුණු සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් , ඒ සඳහා පහත නම් සඳහන් නිලධාරීන් ඇමතිය හැක.

| මාණ්ඩලික නිලධාරියාගේ තනතුර | අංශය | දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල |
|---|---|---|
| අධ්‍යක්ෂ | ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ | 011-2484994 dilipl@tod.treasury.gov.lk |
| අධ්‍යක්ෂ | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශාධාර | 011-2484743 sumedhaw@tod.treasury.gov.lk |
| සහකාර අධ්‍යක්ෂක | ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ | 011-2151487 manabaranag@tod.treasury.gov.lk |
| සහකාර අධ්‍යක්ෂිකා | අයවැය ක්‍රියාත්මක කිරීමේ අංශය - 1 | 011-2484745 himalic@tod.treasury.gov.lk |
| සහකාර අධ්‍යක්ෂක | අයවැය ක්‍රියාත්මක කිරීමේ අංශය - 2 | 011-2484739 be2@tod.treasury.gov.lk |
| සහකාර අධ්‍යක්ෂිකා | අයවැය ක්‍රියාත්මක කිරීමේ අංශය - 3 | 011-2484742 be3@tod.treasury.gov.lk |
| සහකාර අධ්‍යක්ෂිකා | අයවැය ක්‍රියාත්මක කිරීමේ අංශය - 4 | 011-2484744 madushau@tod.treasury.gov.lk |

**එම්.එස්.ඩී.රණසිරි**
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත් -

1. විගණකාධිපති
2. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
3. සියළුම ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් - කරුණාකර ඉහත 3.1 අනුව කටයුතු කිරීම සඳහා
4. සාමාන්‍යාධිකාරි - ලංකා බැංකුව
5. සාමාන්‍යාධිකාරි - මහජන බැංකුව

(4, 5) ඉහත 2.1, 2.2 සහ 3.1 යටතේ සඳහන් කර ඇති පරිදි මුදල් ප්‍රේෂණය කිරීම සඳහා ගිණුම් පවත්වාගෙන යනු ලබන අදාල රජයේ ආයතන වෙත අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා

ආකෘති අංකය: **TOD/IMP/06**

මගේ අංකය :- ................................................

දිනය :- ................................................

කළමනාකරු,
ලංකා බැංකුව/ මහජන බැංකුව,
.................. ශාඛාව.

මහත්මයාණෙනි/මහත්මියනි,

**<u>20..... .12. 31 දිනට මුදල් පොත පියවා</u>**
**<u>ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම</u>**
**ජංගම ගිණුම් අංක .................................**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය:..........................................

අග්‍රිම ගිණුම් අංක:- 7002/0/0/................/....

20... 12.31 දිනට මෙම *අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මුදල් පොතට අනුව "හර" ශේෂය වන රු. ............................................. ක මුදල *ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 2026450 / *මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 014-1-001-3-0110432 ගිණුමේ "බැරට" ප්‍රේෂණය කර මා වෙත "හර" නිවේදනයක් නිකුත් කරන්න.

මෙයට,
විශ්වාසී,

| | |
|---|---|
| ගණකාධිකාරී/නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)<br>අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට | ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්)<br>අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට |
| දිනය :- 20..../.../... | දිනය :- 20..../.../... |

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ අංශය
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

} කරුණාකර ඉහත සඳහන් මුදල් පොතේ ශේෂය අග්‍රිම ගිණුම් අංක 7002/0/0/.... . . ./.. ට බැර කරන්න.

*අදාල නොවන කොටස් කපා හරින්න.

ආකෘති අංකය: TOD/IMP/07

මගේ අංකය :- ............................................

දිනය :- ............................................

කළමනාකරු,
ලංකා බැංකුව/ මහජන බැංකුව,
.................. ශාඛාව

මහත්මයාණෙනි/මහත්මියනි,

<u>20…. . 12. 31 දිනට ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර වෙනුවෙන් වූ මුදල් පොත පියවා ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම</u>

**ජංගම ගිණුම් අංක ............................**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- ......................................................................

ව්‍යාපෘතිය :- ......................................................................

අග්‍රිම ගිණුම් අංක :- 7003/0/0/................/....

20**…**12.31 දිනට ................................................................................... ව්‍යාපෘතියේ මුදල් පොතට අනුව "හර" ශේෂය වන රු. ............................................ ක මුදල *ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 2026450 / *මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම් අංක 014-1-001-3-0110432 ගිණුමේ "බැරට" ප්‍රේෂණය කර මා වෙත "හර" නිවේදනයක් නිකුත් කරන්න.

මෙයට,
විශ්වාසී,

| | |
|---|---|
| මූල්‍ය කළමනාකරු/ව්‍යාපෘති ගණකාධිකාරී<br>ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවට | ව්‍යාපෘති අධ්‍යක්ෂ<br>අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට |
| දිනය : 20.../.../... | දිනය :- 20.../.../... |

පිටපත් : 1.අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
විදේශාධාර කළමනාකරණ අංශය
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.
} කරුණාකර ඉහත සඳහන් මුදල් පොතේ ශේෂය අග්‍රිම ගිණුම් අංක 7003/0/0/…. . . ./.. ට බැර කරන්න.

2.අමාත්‍යාංශ ලේකම් - දැන ගැනීම සඳහා

*අදාල නොවන කොටස් කපා හරින්න.

ආකෘති අංකය: **TOD/IMP/07(i)**

## 20....-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අක් මුදල් සැසඳුම් ප්‍රකාශය
### ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර

1. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- ......................................

2. අග්‍රිම ගිණුම් අංකය :- ......................................

3. ව්‍යාපෘතිය :- ......................................

| මාසය; | ලබාගත් අග්‍රිම (රු.) | | | වියදම (රු.) | | | ශේෂය (රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | RFA (1) | DF (2) | එකතුව (3)=(1)+(2) | RFA (4) | DF (5) | එකතුව (6)=(4)+(5) | RFA (1) -(4) | DF (2)-(5) | එකතුව (3)-(6) |
| ජනවාරි | | | | | | | | | |
| පෙබරවාරි | | | | | | | | | |
| මාර්තු | | | | | | | | | |
| අප්‍රේල් | | | | | | | | | |
| මැයි | | | | | | | | | |
| ජුනි | | | | | | | | | |
| ජුලි | | | | | | | | | |
| අගෝස්තු | | | | | | | | | |
| සැප්තැම්බර් | | | | | | | | | |
| ඔක්තෝබර් | | | | | | | | | |
| නොවැම්බර් | | | | | | | | | |
| දෙසැම්බර් | | | | | | | | | |
| එකතුව | | | XX | | | XX | | | XXX |

වර්ෂය තුළ ලබා ගත් මුළු අග්‍රිමය (3) :- XX

වර්ෂයේ මුළු වියදම (6) :- XX

20... .12.30 දිනට ශේෂය :- XXX

<u>නොපියවූ අත්තිකාරම්; (තිබේ නම්;)</u>

| ගෙවූ දිනය | ආයතනය | හේතුව | මුදල - රු. ශත. |
|---|---|---|---|
| ........... | ................................ | ......................... | X |
| ........... | ................................ | ......................... | X |
| | | | XX |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..............................................

මූල්‍ය කළමනාකරු/ව්‍යාපෘති ගණකාධිකාරී

දිනය : .............................